**මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ණය අංක 2947 එස්ආර්අයි සහ 2948 එස්ආර්අයි) - 2013**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහනේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ ) අතර 2013 ජූනි 28 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ 2.10 වගන්තිය හා අංක 2947 එස්ආර්අයි හා 2948 එස්ආර්අයි දරන ණය ගිවිසුම් සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘතියේ කාලය

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම ආයෝජන වැඩ සටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය හා වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නාගරික පරිසරය හා මහ කොළඹ පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩුකිරීම, මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩි දියුණු කිරීම, ආයතනික ව්‍යුහය සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ආයෝජන වැඩ සටහන් කළමනාකරණය සහ වැඩි දියුණු කිරීම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 112 ක් වන අතර ඉන් එජඩො මිලියන 84 ක් හෙවත් සියයට 75 ක් ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූනි 28 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටත් සපයන ලද අරමුදල් ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

## 3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.47,807,536 ක් සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.62,082,777 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| කාර්යාල උපකරණ | 19,200 | 1,037,028 | 1,056,228 |
| සිවිල් වැඩ | 130,000 | - | 130,000 |
| වර්ධක පුනරාවර්තන පිරිවැය | 47,658,336 | 13,238,213 | 60,896,549 |
| එකතුව | 47,807,536 | 14,275,241 | 62,082,777 |

**4.2 අග්‍රිම ගිණුම**

ව්‍යාපෘතිය සඳහා අංක 74129 – 173 දරන අග්‍රිම ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ගනුදෙනුවක් සිදු වී නොතිබුණි.

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

ආසියානු සංවර්ධන බැංකුව විසින් සමාලෝචිත වර්ෂයේදී අයකරනු ලැබූ රු.මිලියන 1.8ක් වූ ණය පොළී ගිණුම් ගත කර නොතිබුණි.

**5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණන කටයුතු සඳහා ව්‍යාපෘතියේ වැටුප් පත්‍රිකා සාරාංශ පමණක් ලබා දී තිබුණි. ව්‍යාපෘතිය විසින් වැටුප් ලෙස ගෙවූ රු.මිලියන 28.2 ක මුදල එම වැටුප් හා අනෙකුත් දීමනා යනාදිය ගණනය කිරීමේ විස්තරාත්මක වාර්තා නොමැතිවීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,056,228 ක් වූ දේපල, පිරියත හා උපකරණ භෞතිකව පරීක්ෂා කර නොතිබුණි. තවද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**5.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, විගණනයට ඉදිරිපත් කර තිබුණේ, 2014 ඔක්තෝම්බර් 09 දිනය.

(ආ) 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි ව්‍යාපෘතියේ ගණුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ සියළුම මුදල් ගලාඒම්/ගලායාම් පෙන්නුම් නොකර අවසන් මාස දෙකෙහි ගනුදෙනු පමණක් දක්වා තිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කළ කාල පරිච්ඡේදය තුළදී වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු වනු පිණිස, සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්ක අවධාරණය කරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් තිබිය යුතු වුවද ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදන සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| ආ.ස.බැ. | 84 | 11,088 | 900 | - | - | - |
| ශ්‍රී .ලං.ර. | 28 | 3,696 | 400 | 48.48 | 0.47 | 63.14 |
| එකතුව | 112 | 14,784 | 1.300 | 48.48 | 0.47 | 63.14* |

* වර්ෂ අවසානයේ ගෙවිය යුතු හා ලැබිය යුතු අගයන් ඇතුළත් නොවීම නිසා මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන වටිනාකම මේ සමග එකඟ නොවේ.

### 6.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට ඉලක්ක කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 1.99ක් සහ 0.43ක් වී තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව එක් එක් සංරචකයෙහි ( component) කාර්යසාධනය පහත දැක්වේ.

| ව්‍යාපෘති කාර්යය /ව්‍යාපෘති සංරචකය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | ඉලක්කය % | තථ්‍ය % |
| කාන්දුවීම් හඳුනාගැනීමේ උපකරණය සහ එයට සම්බන්ධිත අනෙකුත් උපකරණ සැපයීම හා සවිකිරීම | 30 | 26 |
| ගැලීම් මනු , පීඩන සම්ප්‍රේෂණ පරිවර්තන හා මෘදුකාංග සැපයීම | 20 | 18 |
| ආදායම් රහිත ජල අංශයේ කණ්ඩායම් වෙත වාහන සැපයීම | 30 | 27 |
| බෙදාහැරීම් පද්ධතියට (කොළඹ උතුර) ආදේශ කිරීම හා ප්‍රතිසාධනය කිරීම සඳහා ජලනල සැපයීම හා එළීම | 4 | 2 |

| | | |
|---|---|---|
| බෙදාහැරීම් පද්ධතියට (කොළඹ නැගෙනහිර) ආදේශ කිරීම හා ප්‍රතිසාධනය කිරීම සඳහා ජලනල සැපයීම හා එළීම | 2 | 1 |
| ආදායම් රහිත ජල අංශය සඳහා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම | 2 | 0.4 |
| කළමනාකරණ උපදේශනය හා අධීක්ෂණය | 6.9 | 4.5 |
| මහජනයා දැනුවත් කිරීම හා මාධ්‍ය උපදේශක | 2 | ආරම්භ කර නොතිබුණි. |
| ධාරිතා සංවර්ධනය | 2 | ආරම්භ කර නොතිබුණි. |

## 6.3 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සාමාන්‍ය පරිපාලන කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා සිටියද, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම පරිචයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකර ඒ සඳහා සියයට 20 ක පොදු කාර්ය පිරිවැය අයකර තිබුණි. එබැවින් මහා භාණ්ඩාගාරයෙන් ලැබුනු මුදල් වලින් පොදුකාර්ය පිරිවැය රු. මිලියන 6.9 ක් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබුණි.